අථ ඛො බ්‍රහ්මා **සහම්පති** භගවතො චෙතසා චෙතො පරිවිතක්කමඤ්ඤාය සෙය්‍යථාපි නාම බලවා පුරිසො සම්මිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය, පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය, එවමෙවං බ්‍රහ්මලොකෙ අන්තරහිතො භගවතො. පුරතො පාතුරහොසි.

අථ ඛො බ්‍රහ්මා සහම්පති එකංසං උත්තරාසඞ්ගං කරිත්වා යෙන භගවා තෙනඤ්ජලිං පණාමෙත්වා භගවන්තං එතදවොච: එවමෙතං භගවා, එවමෙතං සුගත. යෙපි තෙ භන්තෙ අහෙසුං අතීතමද්ධානං අරහන්තො සම්මාසම්බුද්ධා තෙපි භගවන්තො ධම්මඤ්ඤෙව සක්කත්වා ගරු කත්වා උපනිස්සාය විහරිංසු. යෙපි තෙ භන්තෙ භවිස්සන්ති අනාගතමද්ධානං අරහන්තො සම්මාසම්බුද්ධා තෙපි භගවන්තො ධම්මඤ්ඤෙව සක්කත්වා ගරු කත්වා උපනිස්සාය විහරිස්සන්ති. භගවාපි භන්තෙ එතරහි අරහං සම්මාසම්බුද්ධො ධම්මඤ්ඤෙව සක්කත්වා ගරු කත්වා උපනිස්සාය. විහරතූති. ඉදමවොච බ්‍රහ්මා **සහම්පති**, ඉදං වත්වා අථාපරං එතදවොච:

යෙ චබ්භතීතා[1] සම්බුද්ධා යෙ ච බුද්ධා අනාගතා,
යො චෙතරහි සම්බුද්ධො බහුන්නං[2] සොකනාසනො.

සබ්බෙ සද්ධම්මගරුනො විහංසු[3] විහරන්ති ච,
අථොපි[4] විහරිස්සන්ති එසා බුද්ධාන ධම්මතා.

තස්මා හි අත්ථකාමෙන[5] මහත්තමභිකඞ්ඛතා,
සද්ධම්මො ගරු කාතබ්බො සරං බුද්ධානසාසනං.

6. 1. 3.

බ්‍රහ්මදෙවසුත්තං.

174. එවං මෙ සුතං: එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරිස්සා බ්‍රාහ්මණියා **බ්‍රහ්මදෙවො** නාම පුත්තො භගවතො සන්තිකෙ අගාරස්මා අනගාරියං පබ්බජිතො හොති.

අථ ඛො ආයස්මා බ්‍රහ්මදෙවො එකො වූපකට්ඨො අප්පමත්තො ආතාපී පහිතත්තො විහරන්තො න චිරස්සෙව යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහාසි. ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති අබ්භඤ්ඤාසි. අඤ්ඤතරො ච පනායස්මා බ්‍රහ්මදෙවො අරහතං අහොසි.

1. යෙ ච අතීතා — මජසං, සයා, PTS. 2. බහූනං - මජසං. 3. විහරිංසු — සයා PTS. සී 1, 2,
4. අථාපි — සයා. තථාපි-මජසං 5. අත්තකාමෙන—සයා. මජසං.

Free Distribution www.aathaapi.org

ඉක්බිති **සහම්පති** බ්‍රහ්ම තෙමේ තමසිතින් භාග්‍යවතුන් වහන්සේගේ චිත්තපරිවිතර්කය දැන යම්සේ බලවත් පුරුෂයෙක් හැකුළු අත දිගු කරන්නේ හෝ, දිගු කළ අත හකුළුවන්නේ හෝ වේ ද, එසෙයින් ම බඹලොව අතුරුදහන් වූයේ භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි පහළ විය.

ඉක්බිති සහම්පති බ්‍රහ්ම තෙමේ උතුරුසළුව එකස් කොට භාග්‍යවතුන් වහන්සේ වෙත ඇඳිලි බැඳ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේ ය: භාග්‍යවතුන් වහන්ස, තෙල එසේ ම ය. සුගතයන් වහන්ස, තෙල එසේ ම ය. වහන්ස, අතීත කාලයෙහි යම් ඒ අර්හත් සම්මාසම්බුද්ධ කෙනෙක් වූ සේක් නම් ඒ භාග්‍යවතුන් වහන්සේත් ධර්මය ම සත්කාර කොට ගුරු කොට ඇසුරු කොට විසූ සේක. වහන්ස, අනාගත කාලයෙහි යම් ඒ අර්හත් සම්මාසම්බුද්ධ කෙනෙක් වන සේක් නම් ඒ භාග්‍යවතුන් වහන්සේත් ධර්මය ම සත්කාර කොට ගුරු කොට ඇසුරු කොට වාසය කරණ සේක. වහන්ස, දැන් භාග්‍යවත් අර්හත් සම්මාසම්බුද්ධරජානන් වහන්සේත් ධර්මය ම සත්කාර කොට ගුරු කොට ඇසුරු කොට වෙසෙන සේක්වායි. **සහම්පති** බ්‍රහ්ම තෙමේ මෙය සැළ කෙළේ ය. මෙය සැළ කොට යළිත් මෙය ද කීය.

අතීතකාලික වූ යම් සම්බුද්ධ කෙනෙක් වූ සේක් ද, අනාගතකාලික වූ යම් සම්බුද්ධ කෙනෙක් වන සේක් ද, බොහෝ දෙනාගේ ශෝකය නසන යම් සම්බුද්ධ කෙනෙකුන් දැන් ඇත් ද,

ඒ සියලු බුද්ධරජානන් වහන්සේ ම සද්ධර්මය ම ගරු කොට ගත්තාහු විසූ සේක. දැන් වසන සේක. වැලිත් (මතු ද) වසන සේක. මේ බුද්ධවරුන්ගේ ස්වභාව යි.

එහෙයින් වැඩ කැමති මහත්බව පතන්නහු විසින් බුදුසසුන සිහි කරමින් සදහම ගුරු කටයුත්තේ ය.

6. 1. 8.

බ්‍රහ්මදේවසූත්‍රය.

174. මා විසින් මෙසේ අසන ලදී: එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ **සැවැත්නුවර** සමීපයෙහි **ජේතවන** නම් වූ **අනේපිඬු** සිටුහුගේ අරම්හි වැඩ වසන සේක. එකල්හි එක්තරා බැමිණියකගේ **බ්‍රහ්මදේව** නම් පුතෙක් ගිහිගෙන් නික්ම භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි පැවිද්දට පැමිණියේ වෙයි

එකල්හි ආයුෂ්මත් **බ්‍රහ්මදේව** තෙමේ එකලා ව ගණයා කෙරෙන් වෙන් ව නොපමා ව කෙලෙස් තවන වෙර ඇති ව නිවන් පිණිස මෙහෙයූ සිත් ඇති ව වසන්නේ යමක් පිණිස කුලපුත්‍රයෝ මැනවින් ම ගිහිගෙන් නික්ම පැවිද්දට පැමිණෙද්ද, සසුන් බඹසරට අවසන් වූ ඒ නිරුත්තර රහත්ඵලය මේ අත්බැව්හි ම තෙමේ විශිෂ්ටඥානයෙන් දැන පසක් කොට පැමිණ විසී ය. ජාතිය ක්ෂීණ වූවා ය. මගබඹසර වැස නිමවන ලදී. සොළොස් කරණී කොට නිමවන ලදී. තෙල කරණී පිණිස නොහොත් රහත්බව පිණිස කළයුතු අන් කරණී නැතැයි වෙසෙසින් දැනගත්තේ ය. ආයුෂ්මත් බ්‍රහ්මදෙවයෝ රහතුන් අතුරෙන් එක්තරා කෙනෙක් වූහ.

අථ ඛො **ආයස්මා බ්‍රහ්මදෙවො** පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවර-මාදාය සාවත්ථිං පිණ්ඩාය පාවිසි. සාවත්ථියං සපදානං පිණ්ඩාය චරමානො යෙන සකමාතුනිවෙසනං තෙනුපසඞ්කමි. තෙන ඛො පන සමයෙන ආයස්මතො බ්‍රහ්මදෙවස්ස මාතා බ්‍රාහ්මණී බ්‍රහ්මුනො ආහුතිං නිච්චං පග්ගණ්හාති. අථ ඛො බ්‍රහ්මුනො සහම්පතිස්ස එතදහොසි: අයං ඛො ආයස්මතො බ්‍රහ්මදෙවස්ස මාතා බ්‍රාහ්මණී බ්‍රහ්මුනො ආහුතිං නිච්චං පග්ගණ්හාති, යන්නූනාහං තං උපසඞ්කමිත්වා සංවෙජෙය්‍යන්ති.

අථ ඛො බ්‍රහ්මා **සහම්පති** සෙය්‍යථාපි නාම බලවා පුරිසො සම්මිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය. එවමෙවං බ්‍රහ්මලොකෙ අන්තරහිතො ආයස්මතො බ්‍රහ්මදෙවස්ස මාතුනිවෙසනෙ පාතුරහොසි. අථ ඛො බ්‍රහ්මා සහම්පති වෙහාසං ඨිතො ආයස්මතො බ්‍රහ්මදෙවස්ස මාතරං බ්‍රාහ්මණිං ගාථාහි අජ්ඣභාසි:

දූරෙ ඉතො බ්‍රාහ්මණී බ්‍රහ්මලොකො යස්සාහුතිං පග්ගණ්හාසි නිච්චං,
නෙතාදිසො බ්‍රාහ්මණී බ්‍රහ්මභක්ඛො කිං ජප්පසි බ්‍රහ්මපථං අජානන්තී.[1]

එසො හි තෙ බ්‍රාහ්මණී බ්‍රහ්මදෙවො නිරූපධිකො[2] අතිදෙවපත්තො,
අකිඤ්චනො භික්ඛු අනඤ්ඤපොසී[3] යො තෙ සො පිණ්ඩාය ඝරං පවිට්ඨො.

ආහුනෙය්‍යො[4] වෙදගූ භාවිතත්තො නරානං දෙවානඤ්ච[5] දක්ඛිණෙය්‍යො,
බාහිත්වා පාපානි අනූපලිත්තො[6] ඝාසෙසනං ඉරීයති[7] සීතිභූතො.

න තස්ස පච්ඡා න පුරත්ථමත්ථි සන්තො විධූමො අනීඝො නිරාසො,
නික්ඛිත්තදණ්ඩො තසථාවරෙසු සො ත්‍යාහුතිං භුඤ්ජතු අග්ගපිණ්ඩං

විසෙනිභූතො උපසන්තචිත්තො නාගොව දන්තො චරති අනෙජො,
භික්ඛු සුසීලො සුවිමුත්තචිත්තො සො ත්‍යාහුතිං භුඤ්ජතු අග්ගපිණ්ඩං.

තස්මිං පසන්නා අවිකම්පමානා පතිට්ඨපෙසි දක්ඛිණං දක්ඛිණෙය්‍යෙ,
කරොහි පුඤ්ඤං සුඛමායතිකං දිස්වා මුනිං බ්‍රාහ්මණී ඔඝතිණ්ණන්ති.

තස්මිං පසන්නා අවිකම්පමානා පතිට්ඨපෙසි දක්ඛිණං දක්ඛිණෙය්‍යෙ,
අකාසි පුඤ්ඤං සුඛමායතිකං දිස්වා මුනිං බ්‍රාහ්මණී ඔඝතිණ්ණන්ති.

---

1. අජානං - මජ්ඣං. ස්‍යා. 2. නිරූපධිකො - මජ්ඣං. ස්‍යා. 3. අනඤ්ඤපොසියො— PTS. 4. ආහුනිය්‍යො - ස්‍යා. 5. දෙවාන ච. — ස්‍යා. 6. අනූපලිත්තො - මජ්ඣං. ස්‍යා. 7. ඉරියති — සී 2.

ඉක්බිති ආයුෂ්මත් බ්‍රහ්මදේව තෙමේ පෙරවරු හැඳ පෙරෙව පාසිවුරු ගෙණ සැවැත්නුවරට පිඩු පිණිස පිවිසියේ ය. සැවැත්නුවර ගෙපිළිවෙළින් පිඩු පිණිස හැසිරෙන්නේ සිය මවුනිවස වෙත එළඹියේ ය. එකල්හි ආයුෂ්මත් බ්‍රහ්මදේව තෙරුන්ගේ මවු බැමිණි තොමෝ බඹහට නිරන්තරයෙන් හෝමපූජා කෙරෙයි. එකල්හි සහම්පති බඹහට ආයුෂ්මත් බ්‍රහ්මදේව තෙරුන්ගේ මේ මවුබැමිණි තොමෝ නිරන්තරයෙන් බඹහට හෝමපූජා කෙරෙයි. මම ඈය වෙත එළඹ සංවේග දනවන්නෙම් නම් යෙහෙකැයි මේ සිත විය.

ඉක්බිති සහම්පති බ්‍රහ්ම තෙමේ යම්සේ බලවත් පුරුෂයෙක් හැකුළු අත දිගු කරන්නේ හෝ, දිගු කළ අත හකුළුවන්නේ හෝ වේ ද, එපරිද්දෙන් ම බඹලොව අතුරුදන් වූයේ ආයුෂ්මත් බ්‍රහ්මදේව තෙරුන්ගේ මවු නිවසෙහි පහළ විය. ඉක්බිති සහම්පති බ්‍රහ්ම තෙමේ අහසෙහි සිටියේ ආයුෂ්මත් බ්‍රහ්මදේව තෙරුන්ගේ මවු බැමිණියට ගාථාවන්ගෙන් කීය.

බැමිණිය, යම් බඹකුට නිතර හෝම කිරීම දක්ෂ කොට ගණිහි ද, (ඔහුගේ ඒ) බඹලොව මෙයින් දුරය මෙබඳු පායාසයෙක් බ්‍රහ්මයන් විසින් අනුභව කළ යුත්තෙක් නො වේ. බ්‍රහ්මපථය නො දන්නී කිම තන් දෙඩවහි ද?

බැමිණිය, තිගේ (පුත් වූ) මේ බ්‍රහ්මදේව තෙරණුවෝ උපධි රහිතයහ. දේවාතිදේව භාවයට පැමිණියහ. රාගාදි පලිබොධ රහිතයහ (තෙල අත්බව පියා) අන් අත්බැවක් හෝ අඹුදරුවන් හෝ පෝෂණය නො කරන්නෙකි. ඒ රහතුන් වහන්සේ තිගේ ගෙට පිඩු පිණිස පිවිසි සේක.

(ඒ රහත් තෙමේ) ආහුනපිණ්ඩය හා පාහුන පිණ්ඩය ද පිළිගැණීමට සුදුසු ය. චතුර්මාර්ග සංඛ්‍යාත වේදයෙහි කෙළවරට පැමිණියේ ය. වඩන ලද සිත් ඇත්තේ ය. මිනිසුන්ගේ ද දෙවියන්ගේ ද දක්ෂිණාවට සුදුසු ය. පව් බැහැර කොට නො තැවරුණේ සිහිල් වූයේ අහර සෙවීම කෙරෙයි.

උන්වහන්සේට අතීත ස්කන්ධයන්හි ද ඡන්දරාගයෙක් නැත. අනාගත ස්කන්ධයන්හි ද ඡන්දරාගයෙක් නැත. ශාන්තය. ක්‍රොධධූම රහිත ය. දුක් රහිත ය. ආශා නැත. අස්ථිර ස්ථිර සත්ත්වයන් (පෘථග්ජන ක්ෂීණාශ්‍රවයන්) කෙරෙහි බහා තැබූ දඬු ඇත්තෙක. හෙ තෙමේ තිගේ ආහුති සංඛ්‍යාත අග්‍ර පිණ්ඩය වළඳාවා.

ක්ලේශසේනා රහිත වූයේ මොනවට සන්හුන් සිත් ඇත්තේ දැමුනු හස්තියකු මෙන් හැසිරෙයි. තෘෂ්ණා නැති මනාසිල් ඇති මැනවින් මිදුනු සිත් ඇති ඒ රහත් තෙමේ තිගේ ආහුති සංඛ්‍යාත අග්‍ර පිණ්ඩය වළඳාවා.

බැමිණිය, පහන්සිත් ඇති ව අචලශ්‍රද්ධා ඇතිව දක්ෂිණාර්හ වූ උන්වහන්සේ කෙරෙහි දක්ෂිණාව පිහිටුව. චතුරොඝ තරණය කළ ඒ රහතුන් වහන්සේ දැක මතු සැප එළවන පින් කරව.

ඒ බැමිණි තොමෝ උන්වහන්සේ කෙරෙහි පහන්සිත් ඇති ව අචලශ්‍රද්ධා ඇතිව දක්ෂිණාවට සුදුසු වූ උන්වහන්සේ කෙරෙහි දක්ෂිණාව පිහිටුවාලූ ය. චතුරොඝතරණය කළ ඒ රහතුන් වහන්සේ දැක මතු සැප එළවන පින් කළා ය.

Free Distribution www.aathaapi.org